BRITISH COUNCIL

# ඉගෙනීමේදී ඔබ උපරිම ඵල ලබාගන්නේ කෙසේද

එක් මට්ටමකින් ඉහළට යාම සඳහා පැය 120ක් සහ පැය 140ක් අතර පාඩම් කාලයක් වැය වනු ඇති බව සිහිතබා ගන්න. මෙම ඉඟි කිහිපයක් භාවිත කිරීමෙන්, ඉගෙනීමේදී ඔබට උපරිම ඵල ලබාගත හැකි වේ. ඔබේ ගුරුවරයාගෙන් ද සහය ලබාගැනීමේ හැකියාව ඔබට තිබේ.

## පංතියට පෙර, ඔබට කළ හැකි දේ:

1. ඔබේ පළමු පාඩමට පෙර, අපගේ MyClub ක්‍රියාකාරකම් වලින් එකක් සඳහා සම්බන්ධ වන ලෙසට අප නිර්දේශ කරමු. ඔබේ කථාව පුරුදු-පුහුණු වීමට, ගුරුවරු සහ වෙනත් සිසු සිසුවියන් හමුවීමට අවස්ථාව හිමිවන මෙම ක්‍රියාකාරකම් ලබාදෙන්නේ නොමිලේ ය. ඒවා අවසානයේ දී ගුරුවරයා විසින් Myclass පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබාදීමට සහ පාඩම් තෝරා ගන්නේ කෙසේද යන්න පැහැදිලි කිරීමට ද යම් කාලයක් මිඩංගු කරනු ඇත.
2. ඔබේ ඉගෙනීම සැලසුම් කරන්න. සතියකට අවම වශයෙන් පාඩම් 2ක් සහ MyClub එකක් සඳහා සහභාගි වීමට සැලසුම් කරන්න. ඔබට හැකිනම්, ඔබේ සතිය පුරාවට ඔබේ පාඩම් සහ ක්‍රියාකාරකම් වල නිරතවීමට කටයුතු කරන්න: නිතර නිතර සිදුකරන කෙටි පුරුදු-පුහුණුව එක් දිගු අවස්ථාවකට වඩා සුදුසු වේ. ස්වයං-ඉගෙනීම සඳහා ද ඔබ විසින්, ඔබේ ඉගෙනීමේ කාලය තුළ වේලාව වෙන්කර ගැනීම අවශ්‍ය වේ.
3. විවිධ ගුරුවරුන් සමග ඉගෙනගෙන බලන්න. එහිදී ඔබ වඩාත් කැමති ගුරුවරයා තෝරාගැනීමේ අවස්ථාව ද ඔබට ලැබෙනු හැකියි.
4. ඔබේ පංති තෝරා ගැනීමේ දී ඔබේ ඉගෙනීමේ ඉලක්කයන් ගැන සිතන්න. ඵලදායී ඉගෙනීමේ ඉලක්කයක් ඔබ විසින් තනා ගැනීමට සහය පිණිස මෙම පිටුව බලන්න.
5. ඔබේ පාඩම් සකසා ගන්න. මාතෘකාව සහ විස්තරය දෙස බලා, එහි අන්තර්ගතයෙන් ආවරණය වන්නේ මොනවාදැයි සිතා බලන්න. ඊට අමතරව, MyClass ද්වාරය (portal) මගින් myResroucesOnline විමසා බැලීමද ඔබ විසින් කළ යුතු ය.

## පංතියේ දී ඔබට කළ හැකි දේ:

1. ඔබ පරිගණකයක් භාවිත කරන්නේ නම්, ඉගෙනීමේදී ඔබට එය පහසුවක් වනු ඇත:
   a. ඔබට වඩාත් පහසුවක් දැනෙනු ඇත.
   b. ජංගම දුරකථනයක් භාවිත කරන විටදී මෙන් නොව, ඔබට වඩා පහසුවෙන් සියලුම ඔන්ලයින් මෙවලම් වෙත ප්‍රවේශ වීමේ හැකියාව, පරිගණකයකින් ලැබෙනු ඇත.
2. ඔබ නිහඬ තැනක් තෝරාගන්නේ නම් එය ඔබටත් ඔබගේ පංති සගයන්ටත් වැඩි පහසුවක් වනු ඇත. නිහඬතාව සහිත කාමරයක් තෝරාගෙන ඔබේ පුද්ගලිකත්වය සඳහා එහි දොර වසා දමන්නට මතක තබාගන්න. ඇතිවිය හැකි ශබ්ද පාලනය කිරීමට ඔබට හැකියාවක් නොමැති බැවින්, පිටත පිහිටි තැන් තෝරා ගැනීමෙන් වළකින්න.
3. ඔබ පාඩම් සඳහා තෝරා ගන්නා තැනට අන්තර්ජාල සබඳතාව මනාව ලැබෙන බවට සහතික කරගන්න. එසේ නොමැති වුවහොත්, අනෙකුත් සිසු සිසුවියන් හා ගුරුවරුන් සමග අන්‍යෝන්‍ය කටයුතු වල නිරත වීමේ අවස්ථාව ඔබට නොලැබෙනු ඇත.
4. අපගේ පංති, අන්‍යෝන්‍යව සිදු කෙරෙන බැවින් පංතිය සමග සක්‍රීයව සම්බන්ධවීම සඳහා ඔබේ විඩියෝ කැමරාව ක්‍රියාත්මක කර තැබීම අවශ්‍ය කෙරෙයි. ඔබ එසේ නොකළහොත්, ඔබේ ගුරුවරයා ඒ ගැන සිහිපත් කරනු ඇත. අපගේ දැඩි ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව මෙය ද වැදගත් අංගයකි.
5. ප්‍රගතිය ලැබීමේ හොඳම මාර්ගය, පංතිය වේලාවේ දී ක්‍රියාකාරීව සහභාගි වීමයි. සාමාන්‍යයෙන් නිහඬව සිටින සිසු සිසුවියන් එතරම් හොඳ ප්‍රගතියක් ලබන්නේ නැත.
6. පංතියේ දී සිදුකරන කාර්යයන් සම්බන්ධයෙන් ඔබේ කාර්ය සාධනය මත පදනම්ව ඔබ ඇගයීමට ලක් කෙරෙනු ඇති බැවින් හැකි උපරිමයෙන් කටයුතු කරන්න.

පංතියෙන් පසු ඔබට කළ හැකි දේ මොනවාද

1. පංතියෙන් පසු, ඔබ විසින් වඩාත් හොඳින් සිදු කළ දෑ ගැනත්, ඔබ විසින් වැඩි උනන්දුවක් දැක්විය යුතු දෑ ගැනත් නැවත සිතා බලන්න. පංතියේ දී ඔබ කළ කටයුතු, myResroucesOnline භාවිතයෙන් පුනරීක්ෂණය කළ හැකි අතර, ලබාගත හැකි සම්පත් සඳහා, myClass portal බලන්න.
2. වැඩිදුර යාමේ ඕනෑකම ඔබට තිබේද? ඔබේ ඉගෙනීම සම්බන්ධයෙන් නොමිලේ ලබාදෙන මෙකී සම්පත් වල සහය ලබාගන්නා ලෙසට අප නිර්දේශ කරමු.

බ්‍රිතාන්‍ය කවුන්සිල වෙබ්අඩවි

ඉංග්‍රිසි ව්‍යාකරණ https://learnenglish.britishcouncil.org/grammar

ඉංග්‍රිසි වචනමාලාව https://learnenglish.britishcouncil.org/vocabulary

ව්‍යාපාරික ඉංග්‍රිසි https://learnenglish.britishcouncil.org/business-english

සාමාන්‍ය ඉංග්‍රිසි (අමතර පුහුණුව : ද්‍රශ්‍ය, ශ්‍රව්‍ය, සඟරා, කතාන්දර කලාප සහ යෙදුම්) https://learnenglish.britishcouncil.org/general-english

ප්‍රජා ඉසව් (සම්බන්ධවීම නොමිලේ, YouTube සහ Facebook වෙතින් ලබාගත හැකි පටිගත කිරීම්) https://learnenglish.britishcouncil.org/online-courses/community-events

Others වෙනත්

BBC ඉංග්‍රිසි උගනිමු (ස්වයං-ප්‍රවේශය ලබාගත හැකි විවිධාකාර ද්‍රව්‍ය සහ යාවත්කාලීන කරන ලද ක්‍රියාකාරකම්) https://www.bbc.co.uk/learningenglish/

කේම්බ්‍රිජ් ඉංග්‍රිසි ලිවීම සහ වැඩිදියුණුව (මෘදුකාංග වෙතින් ප්‍රතිචාර සහිත වූ අන්තර්-මට්ටමේ ලිවීමේ කාර්යයන්) https://writeandimprove.com/free

නිර්දේශන

ඉංග්‍රිසි භාෂාවෙන් තේරුම් ගැනීමට පහසු අර්ථ නිරූපණ ලබාදෙන, පුහුණුවන්නන් සඳහා වූ ශබ්දකෝෂයක් භාවිත කරන ලෙසට අප නිර්දේශ කරමු. ඔබ ඉගෙනීමට අදහස් කරන භාෂාව විමසා බැලීමේ වැඩි අවස්ථාවක් එමගින් ඔබට ලැබෙනු ඇති අතර, මව් භාෂාවට අමතරව තවත් භාෂාවක් ඉගෙනීමේ දී එය බෙහෙවින් අත්‍යවශ්‍ය වේ.

කේම්බ්‍රිජ් ශබ්දකෝෂය https://dictionary.cambridge.org/dictionary/learner-english/

## IELTS Coach ඉඟි

IELTS සාම්පල ප්‍රශ්න පුරුදු-පුහුණුව ඔබට මෙතැනින් කළ හැකියි: https://www.ielts.org/for-test-takers/sample-test-questions

ඔබගේ ඉලක්කගත සූචික සම්බන්ධ දැනුම හා පුරුද්ද ඔබ විසින් ඇති කරගත යුතුයි. ඔබගේ ඉලක්ක කරා යාමට අවශ්‍ය කටයුතු ඔබ විසින් සිදුකරන බව එමගින් සහතික කරගත හැකියි.

පොදු IELTS සූචක:

ලිවීමේ කාර්ය 1

https://takeielts.britishcouncil.org/sites/default/files/ielts_task_1_writing_band_descriptors.pdf

ලිවීමේ කාර්ය 2

https://takeielts.britishcouncil.org/sites/default/files/ielts_task_2_writing_band_descriptors.pdf

කියවීමේ කාර්යය https://www.ielts.org/-/media/pdfs/speaking-band-descriptors.ashx?la=en

පරීක්ෂණයකට මුහුණදීමට සූදානම් ද? අපගේ උපදෙස් පිටුව බලන්න

https://takeielts.britishcouncil.org/take-ielts/test-day-advice